# තවත් ජූලි වැඩවර්ජනයක්

අවුරුදු විසි අටකට පසු තවත් ජූලි වැඩවර්ජනයක් දහවැනිදාට ඇරඹීමට නියමිත ය. එදා කම්කරු වැඩවර්ජන කැඳ කෝප්ප සටන් යැයි කී ජ වි පෙ මෙදා වැඩවර්ජනය මෙහෙයවයි. එදා වැඩවර්ජනය රාජ්‍ය බලය යොදා මර්දනයට ලක්කළ එ ජා ප මෙදා වැඩවර්ජනයට සහාය දක්වයි. එදා වැඩවර්ජනයට සහාය දුන් දේශපාලන පක්ෂ අද වැඩවර්ජනයට විරුද්ධ වෙයි. මේ සියල්ලෙන් පෙනී යන ප්‍රධාන ම දෙය නම් ඊනියා කම්කරු පංතිය යනුවෙන් පංතියක් නැති බව ය. එ ජා ප හැරෙන්නට වැඩවර්ජනයට එදා හෝ මෙදා හෝ සහාය දුන් විරුද්ධ වූ පක්ෂ ඒ කියමනට විරුද්ධ වනු නියත ය. ඇතැම් විට එ ජා පක්ෂය පවා කම්කරු පංතිය යනුවෙන් පංතියක් ඇතැයි කියනු ඇත.

ඒ කෙසේ වෙතත් මේ තීරුව ලියැවෙන්නේ කම්කරු පංතියක නොපැවතීම ගැන කීමට නො වේ. එදා ජූලි වැඩවර්ජනය මෙන් ම මෙදා ජූලි වැඩවර්ජනය ද නොසිදුවිය යුතුව තිබුණු හා නොසිදුවිය යුතු සිද්ධි බව කීමට ය. එදා ජූලි වැඩවර්ජනයට මාස කිහිපයකට පෙර ඒ වැඩවර්ජනයේ ප්‍රධාන කාර්යයක් ඉටුකළ නව සමසමාජ පක්ෂයෙන් මම ඉල්ලා අස්වීමි. ඒ වැඩවර්ජනයක් නිසා නොව ප්‍රධාන වශයෙන් ම මාක්ස්වාදය විද්‍යාත්මක ද යන්න අරභයා ඇති වූ මතභේදයක් හේතුකොටගෙන ය. ඒ මතභේදය මා වෛතුල්‍යවාදයෙන් මහාවිහාරයට ආපසු ගිය ගමනේ පළමු පියවර විය. ටික කලෙකින් ම මාක්ස්වාදය පමණක් නොව විද්‍යාව ද අවිද්‍යාවක් බව මට වැටහිණි.

අසූවේ ජූලි වර්ජනය කෙරුණේ අනුචිත අවස්ථාවක ය. ජේ ආර් ජයවර්ධන මහතා තම බලය තහවුරු කරගැනීමේ ව්‍යාපෘතියක යෙදී සිටියේ ය. ඔහු ඒ බල ව්‍යාපෘතිය වෙනුවෙන් ඕනෑම පියවරක් ගැනීමට සූදානම් ව සිටියේ ය. රාජ්‍යය මෙන් ම ආණ්ඩුව ද ශක්තිමත් විය. අවුරුදු විසි අටකට පසුව කම්කරුවන් සිය දිවි නසාගැනීමේ මාවතට ඇද දැමීම පිළිබඳ වරදකරුවා කවුරුන් දැයි සොයා ඒ පිළිබඳ විනිශ්චයක් දීමේ අවශ්‍යතාව මට නැත.

කම්කරුවන්ට එදත් අදත් කළහැක්කේ වෘත්තීය සමිති සටන් පමණ ය. ජ වි පෙ මේ සටන්වලට කැඳකෝප්ප සටන් යැයි කීම තේරුම් ගත හැකි ය. එහෙත් එමගින් ඔවුන් කැඳ කෝප්පයට කළ අගෞරවයට සමාව දිය යුතු ද නැත් ද යන්න ගැන පසුව තීරණයක් ගත යුතු ය. කැඳ බීල ද ආවේ වැනි පාඨ ඔස්සේ ජනතාවට කැඳ එපාකිරීමට කටයුතු කළෝ බ්‍රිතානිහු ය. තමන් අනුකරණය කරන්නේ බ්‍රිතානීන් බව නොදැන වුවත් ජ වි පෙ එමගින් කීවේ කුමක් ද යන්න පැහැදිළි ය. ඒ කුමක් වුවත් කම්කරුවන්ගේ වැඩ වර්ජන නිසා සමාජ විප්ලවීය තත්වයන් පැන නො නගියි. මේ සටන් වෘත්තීය සමිති සටන්වලින් ඔබ්බට නො යයි. අද එවැනි සටන්වලට ද වලංගු බවක් නැත.

අසූවේ ජූලි වැඩවර්ජනයෙන් රාජ්‍යයට වූ රිදීමක් නැත. අඩු තරමින් ආණ්ඩුවට කෙනිත්තිලක් කිරීමට තරම්වත් ශක්තියක් වර්ජනයෙහි නො විය. අද තත්වය එයට ද වඩා දුර්වල ය. අද ජ වි පෙ පමණක් නොව එ ජා පක්ෂය ද දෙකඩ වී ය. ඒ පක්ෂ දෙකම ජාතිකත්වයෙන් ඈත්වූ දේශපාලනයක නිරත වෙයි. පනස් හයෙන් පසුව පළමු වරට ජනතාවගෙන් ඉතා විශාල පිරිසක් අද ජාතිකත්වය සමග වෙයි. පනස් හයේ සිංහල රාජ්‍ය භාෂාව වීම සමග තම ආර්ථික ශක්තිය වැඩිවනු ඇතැයි සිංහල පමණක් උගත් පිරිස සිතන්නට ඇත. ඒ අර්ථයෙන් එහි යම් පෞද්ගලික ලාභාපේක්ෂාවක් ද විය. එහෙත් අද ජනතාව ජාතිකත්වය සමග ඇත්තේ එවැනි සුළු හෝ ලාභයක් වේ යැයි බලාපොරොත්තුවෙන් නො වෙයි. අද අවශ්‍ය වී ඇත්තේ කොටි ත්‍රස්තවාදය මුලිනුපුටා රට බෙදීම වැළැක්වීම ය.

එදා වැඩවර්ජනයෙන් පසුව සිදු වුයේ වැඩවර්ජනයට නායකත්වය දුන් පක්ෂ තව තවත් දුර්වල වීම පමණ ය. අනෙක් අතට ආණ්ඩුව තවත් ශක්තිමත් විය. අනූවේ දශකය ආරම්භ වන තෙක් ම ශ්‍රී ල නි පක්ෂයට කරකියා ගත හැකි දෙයක් නො වී ය, ඒ ශ්‍රී ල නි ප වැඩ වර්ජනයේ ඉහළ නායකත්වයක් නොදැරූ තත්වයක ය. ජාතිකත්වයේ පක්ෂය ලෙස ශ්‍රී ල නි පක්ෂය බිහිවීමත් සමග ක්‍රමයෙන් දේශපාලන ලෝකයේ පරිහානියට පත් වූ මාක්ස්වාදී පක්ෂවලට යන එන මං නැති විය. ඔවුන් ඉතා වැඩි පිරිසකට අද ඇත්තේ රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ බටහිරයන්ගෙන් ලැබෙන රැකවරණය පමණ ය. බටහිර ස්වාමීන්ගෙන් ලැබෙන අධිරාජ්‍යවාදී මුදල් නොවන්නට මේ කසිකබල් අධිරාජ්‍ය විරෝධීන් අද උන්නා ද මළා ද කියාවත් කිසිවෙක් නො දනිති. සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය දුර්වල වුයේ හැටහතරේ ශ්‍රී ල නි පක්ෂය සමග සභාග ආණ්ඩුවක් පිහිටුවීම නිසා නොව ශ්‍රී ල නි ප බිහිවීමත් සමග ඒ පක්ෂවලට

© Prof. Nalin De Silva

දේශපාලන ලොකයේ භූමිකාවක් නොතිබීම හේතුවෙනි. ඒ පක්ෂ යම්තම්න්වත් අද පණ රැකගෙන සිටින්නේ ශ්‍රී ල නි පක්ෂය සමග එකතු වී සිටීම නිසා ය! සභාගයට නොගිය මාක්ස්වාදීන්ට වුයේ කුමක් ද යන්න සළකා බැලීමෙන් මේ සභාග කතාව තවත් පැහැදිළි කරගත හැකි ය. ඔවුන්ට අද බටහිර මුදල් සරණ යෑමට සිදු වී ඇත.

අද ජනතාවට ආර්ථික වශයෙන් අමාරුකම් ඇති බව සැබෑ ය. ජීවන වියදම එන්න එන්න ම වැඩි වෙයි. ලැබෙන වැටුප කිසි සේත්ම ප්‍රමාණවත් නැත. විශේෂයෙන් ම අඩු වැටුප් ලබන්නන්ට ජීවන වියදම් ප්‍රශ්නය බරපතළ වී ඇත. ඒ අතර දූෂණය හා නාස්තිය ද විශාල වශයෙන් වැඩි වී ඇත. එහෙත් මේ සියල්ල මැද කොටි සංවිධානයට එරෙහි මෙහෙයුම් නොකඩවා කෙරී ගෙන යයි. ඉදිරියේ දී කොටින්ට එරෙහිව කිරීමට ඇති සටන මෙතෙක් කළ සියළු සටන්වලට වඩා බරපතළ බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. ප්‍රභාකරන් ඇත්තේ ඉතිරි භූමිභාගයේ නම් ඒ බිම ආරක්ෂා කරගැනීමට කොටි සියළු ශක්තිය යොදවනු ඇත. සටන් ඉතා දරුණු වනු ඇත. ඇතැම්විට ඒ සටන් තවත් අවුරුද්දක් දික්ගැසීමට ඉඩ ඇත.

අද මුළු රටම  එක්විය යුත්තේ ඒ සටන් ජයගැනීම සඳහා ය. ඒ සඳහා හමුදාවන්ට දියහැකි සියළු ශක්තිය හා ධෛර්යය ලබාදිය යුතු ය. එහි දී ජනතාවට යම් යම් පරිත්‍යාගකිරීමට සිදුවනු නො අනුමාන ය. එහෙත් ත් සම්බන්ධයෙන් ආණ්ඩුවේ මැති ඇමතිවරුන් යහපත් ආදර්ශයක් සපයා නොමැති බව කණගාටුවෙන් වුව ද කිව යුතු ය. එක් එක් ඇමතිවරයා යොදාගන්නා වාහන සංඛ්‍යාව මගින් ජනතාවට කියන්නේ මේ රටේ ආර්ථික ප්‍රශ්නයක් නොමැති බව ය. මැති ඇමතිවරු පමණක් නොව නිලධාරි මට්ටමේ ද නාස්තිය වැඩි වී ඇත. ආණ්ඩුවේ වියදම රටට ඔරොත්තු දිය හැක්කක් නො වෙයි.

ආණ්ඩුවේ නාස්තිය හා දූෂණය ඉහවහා ගොස් ඇති විට ජනතාවට පටි තද කරගැනීමට කිව නො හැකි ය. එහෙත් ඒ අතර යම් පරිත්‍යාගයක්  කිරීමට ජනතාව සූදානම් විය යුතු ය. වැඩ වර්ජන ශිෂ්‍ය උද්ඝෝෂණ ආදිය යල්පැන ගිය සටන් ක්‍රම වෙයි. මෙවැනි සටන් ඔස්සේ බලයට පැමිණිය හැකිය යන මතයක් කලක් ලෝක මාක්ස්වාදී ව්‍යාපාරයෙහි විය. මහා වැඩවර්ජනයක් රුසියා විප්ලවයට පූර්විකාවක් ලෙස ද ඇතැම්හු සැලකූහ. එහෙත් හැට අටේ යුරෝපයේ ඇති වූ ශිෂ්‍ය සටන් මෙවැනි සටන්වල අවසාන පරිච්ඡේදය ලෙස සැලකිය හැකි ය. තවදුරටත් මේ සටන්ක්‍රම වලංගු නොවනවා පමණක් නොව එවැනි සටන් මෙහෙයවන දේශපාලන පක්ෂ ඉතිහාසයේ කසල ගොඩට විසිවෙන බව ද පෙනී ගොස් ඇත. එවැනි පක්ෂ දේශපාලනයෙන් සදහට ම ඉවත්වන බවක් මෙයින් නොකියැවෙයි. ඒ පක්ෂ සදහට ම ඒ කසල ගොඩේ ම පවතියි.

අද ජ වි පෙරමුණේ දේශපාලනය යොමු වී ඇත්තේ ඒ කසල ගොඩ දිශාවට ය. කසිකබල් මාක්ස්වාදී අදහස්වලින් කැඩීමට නොහැකි ඒ පක්ෂය රුසියා යථාර්ථයක් වාස්තවිකත්වයක් ගැන විශ්වාස කරමින් තමන් නොදන්නා ක්වොන්ටම් භෞතිකයක් ගැන අදබාල පාක්ෂිකයන්ට කියා දෙමින්  ස්වයං මෝහනයකට පත් ව කටයුතු කරයි. ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට පහර දීම හෙළා දැකිය යුතු මුත් උන්වහන්සේලා පහර කෑම සඳහා අධි ආරක්ෂිත කලාපයට තල්ලු කළ දේශපාලන පක්ෂය භික්ෂුත්වයට හානි සිදු කළ ඒ සිද්ධියට වඩාත් ම වගකිව යුතු ය. එ ජා පක්ෂයේ ද සහාය ලබා කරන වෘත්තීය සමිති සටන් ගැන කියනුම කවරේ ද? මේ වැඩ වර්ජනයෙන් ආණ්ඩුවට රිද්දවීමට නො හැකි ය. ඉන් ජ වි පෙ මෙන් ම එ ජා පක්ෂය ද තවත් පිරිහෙනු ඇත. වැඩවර්ජනයෙන් යම්කිසි හේතුවක් නිසා ආණ්ඩුව පෙරළුණා යැයි කියමු. එවිට බලයට ඒමට ඉඩ ඇත්තේ ජ වි පෙට නොව එ ජා පක්ෂයට ය. ඒ එසේ සිදු නොවුණත් ඒ අර්ථයෙන් ගතහොත් වර්ජනයේ වාසිය එ ජා පක්ෂයට ය. එයින් ද අනෙක් සියළු කරුණුවලින් ද වැඩ වර්ජනයේ වාසිය වෙන කිසිවකුටවත් නොව කොටි සංවිධානයට ය. මුළු රට ම එක් වී ඇමතිවරුන්ගේ අමනකම් හා ආර්ථික අමාරුකම් මැද වුවත් කොටින්ට විරුද්ධ සටනට තම උපරිම දායකත්වය පිරිනමනු වෙනුවට හමුදාවේ වැඩ කටයුතු අඩාළ වන අයුරින් වර්ජන කිරීම ගැන ප්‍රභාකරන් සතුටු වනු නො අනුමාන ය. ජනතාවට සහනයක් දීම සඳහා ආණ්ඩුව රුපියල් දාහක දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත. එය පුලියේ ලැබිය යුතු ජීවන වියදම් දීමනාවට අමතරව යැයි සිතමු. ඒ දීමනා දෙකට තවත් රුපියල් දෙසීය පනහක් එකතුකිරීමෙන් රුපියල් දෙදහසක දීමනාවක් ගෙවීමටත් මැති ඇමතිවරුන්ගේ වියදම්  අඩුකිරීමටත් කටයුතු කර කොටි සමූලඝාතනයට මුළු වෙර දැරිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva